# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.20 පැය 2225 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/790 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. පිස්තෝල අවියක් හා එම පතොරම් ගැබක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.04.19 වන දින ගම්පහ පොලිස් වසමේ වතුමුල්ල ප්‍රදේශයේදී, පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත නිවසක් පරික්ෂා කර T56 ගිනි අවි 02 ක්, T56 පතොරම් 118 ක්, T56 පතොරම් ගැබ් 03 ක්, වෑන් රථයක්, කාර් රථයක් හා ත්‍රීරෝද රථයක්ද සමඟ සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්නය සඳහා කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර තිබුණි.

එම සැකකරුවන් අතුරින් T56 අවියට භාවිතා කල හැකි පතොරම් ගැබක් හා එම පතොරම් ගැබට යොදා තිබූ පතොරම් 21 ක් සන්තකයේ තබාගෙන සිටි වයස අවුරුදු 24 ක් වන අස්ගිරිය ප්‍රදේශයේ පදිංචි සැකකරු සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමශර්නයේදී සැකකරුගේ නිවසේ තිබී විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල වගර්යේ ගිනි අවියක් හා එයට යොදන හිස් පතොරම් ගැබක් කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2025.04.20 වන අද දින සොයා ගෙන ඇත.

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගොතටුව පොලිස් ස්ථානය.**

2025.04.20 වන අද දින උදෑසන කාලයේ ගොතටුව පොලිස් වසමේ ගොතටුව නව නගරයේදී ගොතටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන කැළණිමුල්ල, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගොතටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. විදෙස් රටක නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හොරොව්පොතාන පොලිස් ස්ථානය.**

2025.04.20 වන අද දින දහවල් කාලයේ හොරොව්පොතාන පොලිස් වසමේ පට්ටියාවල ප්‍රදේශයේදී හොරොව්පොතාන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **විදෙස් රටක**

**නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන පට්ටියාවල, පරංගියාවාඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරොව්පොතාන පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - තෙරිපැහැ පොලිස් වසම.**

2025.04.20 වන අද දින උදෑසන කාලයේ තෙරිපැහැ පොලිස් වසමේ නිල්දණ්ඩාහින්න තෙරිපැහැ ප්‍රධාන මාගර්යේ මාහේන ප්‍රදේශයේදී තෙරිපැහැ දෙස සිට නිල්දණ්ඩාහින්න දෙසට ධාවනය වූ කැබ් රථයක් බෑවුම් සහිත වංගුවක් අසලදී පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ ගමන් කල පිරිමි පුද්ගලයන් තිදෙනෙකු, කාන්තාවන් සිව් දෙනෙකු සහ දරුවන් තිදෙනෙකු මාවනැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා ඉන් අට දෙනෙකු නුවරඑළිය රෝහලට මාරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී එක් පිරිමි පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ රජගලතැන්න, අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නුවරඑළිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තෙරිපැහැ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**